Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංක | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේතය | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | පුස්තකාල උපස්ථායක | 03 | PLI - 2016 | රු. 24,250-10×250-10×270-10×300-12×330 රු. 36,410 (මෙම වැටුප හිමිවන්නේ 2020.01.01 වන දින සිට වන අතර, 3/2016 චක්‍ර ලේඛයේ උපලේඛන 11 හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.) | (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)<br><br>(ආ) මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයන්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |

| අනු. අංක | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේතය | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 02 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | PLI - 2016 | රු. 24,250-10×250-10×270-10×300-12×330 රු. 36,410 (මෙම වැටුප හිමිවන්නේ 2020.01.01 වන දින සිට වන අතර, 3/2016 චක්‍ර ලේඛයේ උපලේඛන 11 හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.) | *(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) *(ආ)* මෙම පරිපාටිය ක්‍රියාත්මක දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම්/ ආදේශක/ කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින් පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |

02. ඉහත සඳහන් සියලු තනතුරු වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි අනුව පාලනය වේ.

03. *වයස.* - අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි අයකු විය යුතුය. දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් ට ද, මෙම ප්‍රාදේශීය සභාවේ අනියම්/ ආදේශක / කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට ද, ඔවුන්ට පමණක් පෞද්ගලික වන සේ උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

04. *වෙනත් කොන්දේසි :*

(I) සෑම තනතුරකටම බඳවා ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ 11 වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාළ වේ.

(II) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(III) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03 ක් තුළ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

(IV) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුත් අයෙකු විය යුතුය

(V) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

05. *පත්වීමේ ස්වභාවය :*

1. මෙම තනතුර ස්ථිරය. රජයේ සේවකයින් සඳහා 2016 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට රජය විසින් තීරණය කරනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමය ඔබට අදාළ වනු ඇත. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

06. තනතුර සඳහා ඉල්ලීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2018.12.06 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව, නාත්තන්ඩිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය.

07. තනතුරු එකකට වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.

08. අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

(I) උප්පැන්න සහතිකය
(II) ජාතික හැඳුනුම්පත
(III) අධ්‍යාපන සහතික
(IV) ස්ථිර පදිංචිය තහවුරු කිරීමේ සහතිකය (ග්‍රාම නිලධාරි සහතිකය)
(V) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (ඉන් එකක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරියාගෙන් විය යුතුය)
(VI) වෘත්තීය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දක්වෙන සහතික
(VIII) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

*බඳවා ගැනීමේ ක්‍රමය ඃ*

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත බඳවා ගැනීම් සිදු කෙරේ. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමින් සේවය කරන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමිවනු ඇත.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර තුරේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

කේ. පී. චන්දන කුමාර,
ලේකම්,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව,
නාත්තන්ඩිය.

2018 නොවැම්බර් මස 05 වැනි දින,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

***නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ ........................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————————————.
02. ලිපිනය :————————————
03. දුරකථන අංකය :————————————
04. උපන්දිනය : අවුරුද්ද :—————— මාසය :—————— දිනය :——————
05. ජාතික හැඳුනුම්පත් අංකය :————————————
06. ජාතිය :————————————
07. විවාහක/ අවිවාහක බව :————————————
08. ...................................... දිනට වයස ඃ අවුරුදු :—————— මාස :—————— දින :——————
09. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද ? :————————————
එසේ නම් පරම්පරාවෙන්ද ? ලියාපදිංචියෙන් ද ? :————————————
10. ස්ත්‍රී/ පුරුෂ භාවය:————————————
11. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය )
12. වෙනත් සුදුසුකම් :————————————
13. පළපුරුද්ද :————————————
14. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාල සීමාව
...................................... සිට ................................... දක්වා
15. පෙර සේවය කර ඇති ස්ථාන :————————————
16. යම් කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක වරදකරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර :————————————

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි වන අතර, යම් හෙයකින් මා සාවද්‍ය තොරතුරක් සපයා ඇත්නම් පත්වීම් ලබා දීමෙන් අනතුරුව නිසි වන්දියකින් තොරව මා සේවයෙන් ඉවත් කළ හැකි බවද ඊට පෙර අනාවරණය වුවහොත් මෙම තනතුර ලබා ගැනීම සඳහා මා සුදුස්සෙකු නොවන බවද මම දනිමි. අයදුම්පත් කැඳවීමේ දැන්වීමේ සඳහන් කරුණු වලට එකඟවන බවත් මෙයින් සහතික කරමි.

පහත සඳහන් ලිපි ලේඛනවල ඡායා පිටපත් මෙයට අමුණා ඇත.

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතික,
03. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික,
04. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
05. ස්ථිර පදිංචිය තහවුරු කිරීමේ සහතිකය (ග්‍රාම නිලධාරි සහතිකය),
06. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්,
07. ජාතික හැඳුනුම්පත.

..............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :................................

*දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

ඉහත අයදුම්කරු ................................ දින සිට මෙම ආයතනයේ ...................................................වශයෙන් සේවය කරන බවත්, ඔහු/ඇය විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මෙයින් සහතික කරමි.

.

..............................................
අත්සන.

දිනය :.................................